# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2018

## ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2018

## ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

පටුන

1 හැඳින්වීම ... 1
1.1 දැක්ම ... 1
1.2 මෙහෙවර ... 1
1.3 ප්‍රධාන පරමාර්ථ ... 1
1.4 කාර්යය මණ්ඩල තොරතුරු ... 1
2 මෙහෙයුම් ඒකක ... 5
2.1 ප්‍රධාන කාර්යාලය ... 5
2.2 දෙහිවල ජාතික සත්වෝද්‍යානය ... 5
2.3 පින්නවල අලි අනාථාගාරය ... 5
2.4 පින්නවල සත්වෝද්‍යානය ... 5
2.5 හම්බන්තොට සෆාරි උද්‍යානය ... 6
2.6 ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ ... 6
3 සත්ත්ව සංරක්ෂණය සහ අභිජනනය ... 7
3.1 සත්ත්ව එකතුව ... 7
3.2 සත්ත්ව අභිජනනය ... 8
3.3 2018 වර්ෂයේ සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිල දී ගැනීම ... 9
4 අධ්‍යාපනික, පර්යේෂණ, විශේෂ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් ... 10
4.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය ... 10
4.2 පින්නවල අලි අනාථාගාරය ... 11
4.3 පින්නවල සත්වෝද්‍යානය ... 12
4.4 හම්බන්තොට සෆාරි උද්‍යානය ... 14
4.5 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් ... 15
4.6 දෙපාර්තමේන්තුව ලබා ගත් ජාතික මට්ටමේ සුවිශේෂී ජයග්‍රහණ ... 18
5 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සංචාරක පැමිණීම සහ ආදායම ... 19
5.1 2018 වසරේ සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම ... 19
5.2 2017 සහ 2018 අතර සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම සංසන්දනය ... 20
5.3 උද්‍යාන සඳහා සංචාරක පැමිණීම සහ ආදායම (2018.12.31 දක්වා) ... 20
5.4 2010 වසරේ සිට 2018 වසර දක්වා සංචාරක පැමිණීම සහ ආදායම ... 20
6 මූල්‍ය ප්‍රගතිය ... 21
6.1 රජයේ ඒකාබද්ධ අරමුදල ... 21
6.2 සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල ... 23
6.3 වියදම් තොරතුරු සාරාංශය - 2018 ... 24
6.4 2017 සංවර්ධන අරමුදල සහ රජයේ ඇස්තමේන්තුවේ ආදායම් හා වියදම් විශ්ලේශණය ... 24
7 ව්‍යාපෘති භෞතික ප්‍රගතිය ... 25
7.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ප්‍රධාන සංවර්ධන කාර්යයන් ... 25
7.2 පින්නවල අලි අනාථාගාරයේ ප්‍රධාන සංවර්ධන කාර්යයන්. ... 27
7.3 පින්නවල නව සත්වෝද්‍යානයේ ඉදිකිරීම් කටයුතු ... 29
7.4 හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු. ... 31

# 1 හැඳින්වීම

වන සතුන් පිටරට සත්වෝද්‍යාන වෙත ප්‍රවාහනය කරන තුරු රඳවා තබා ගන්නා පුද්ගලික වන සත්ත්ව එකතුවක් ලෙස 1920 දශකයේ පෙර භාගයේ දී දෙහිවල ප්‍රදේශයේ අක්කර 11ක භූමි භාගයක් තුළ ජර්මන් ජාතික ජෝන් හාගෙන්බර්ග් මහතා විසින් ආරම්භ කරන ලද දෙහිවල සත්වෝද්‍යානය වර්ෂ 1936 ජූලි 03 වන දින රජයට පවරා ගන්නා ලදී.

පසුව මෙම සත්වෝද්‍යානය වර්ෂ 1946 දී ස්වාධීන රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලදී. පසුව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පාලනය සහ කළමනාකරණය කිරීමේ කටයුතු 1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන යටතට පත් කරන ලදී.

මේ වන විට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ දෙහිවල ජාතික සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානයේ ශ්‍රී ලංකානු කලාපය සහ රිදියගම සෆාරි උද්‍යානය යන උද්‍යාන ද ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ ද පාලනය වේ.

## 1.1 දැක්ම

"ලෝකයේ විශිෂ්ටතම සත්වෝද්‍යාන පවත්වා ගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීම."

## 1.2 මෙහෙවර

"නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ, ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාවයන් උපයෝගී කර ගනිමින්, පිළිගත් නීති රීති වලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම."

## 1.3 ප්‍රධාන පරමාර්ථ

- සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය
- සත්ත්ව සුබසාධනය
- අධ්‍යාපනය
- පර්යේෂණ
- ප්‍රදර්ශනය හා විනෝදාස්වාදය ලබා දීම

## 1.4 කාර්යය මණ්ඩල තොරතුරු

2018.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 881ක් වන අතර එදිනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 712කි.

*වගුව 01: සේවක වර්ගීකරණය අනුව 2018.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා එදිනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව*

| සේවක වර්ගීකරණය | | 2018.12.31 දිනට සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | අනුමත | සේවයේ නියුතු |
| 1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 23 |
| 2 | තෘතීය මට්ටම | 02 | 01 |
| 3 | ද්විතීය මට්ටම | 185 | 145 |
| 4 | ප්‍රාථමික මට්ටම | 665 | 543 |
| එකතුව | | **881** | **712** |

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2018.12.31 දිනට අනුමත තනතුරු අනුව සේවක සංඛ්‍යාව හා එදිනට සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

*වගුව 02 : 2018.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව*

| අනු අංකය. | තනතුරු නාමය | සේවය | ශ්‍රේණිය/ පංතිය | වැටුප් පරිමාණය | *ක.සේ.දෙ. වේ අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මුළු | මුළු | |
| **ජ්‍යෙෂ්ඨ** මට්ටම | | | | | | | |
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | දීප ව්‍යාප්ත සේවා | විශේෂ | SL 1 | 1 | 1 | 0 |
| 2 | අධ්‍යක්ෂ (පරිපාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | I | SL 1 | 1 | 0 | 1 |
| 3 | අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය හා පෝෂණ) | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | I | SL 1 | 1 | 1 | 0 |
| 4 | අධ්‍යක්ෂ (මෙහෙයුම්) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | I | SL 1 | 1 | 0 | 1 |
| 5 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | I | SL 1 | 1 | 1 | 0 |
| 6 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | I | SL 1 | 1 | 1 | 0 |
| 7 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | II/III | SL 1 | 8 | 8 | 0 |
| 8 | ඉංජිනේරු (සිවිල්) | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | II/III | SL 1 | 1 | 1 | 0 |
| 9 | පශු වෛද්‍ය | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | II/III | SL 1 | 11 | 9 | 2 |
| 10 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය | II/III | SL 1 | 1 | 1 | 0 |
| 11 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | II/III | SL 1 | 2 | 0 | 2 |
| තෘතීය මට්ටම | | | | | | | |
| 12 | පරිපාලන නිලධාරී | ඒකාබද්ධ සේවය | Supra | MN 7 | 2 | 1 | 1 |
| ද්විතීය මට්ටම | | | | | | | |
| 13 | අධ්‍යාපන නිලධාරී | ආශ්‍රිත සේවා | I/II/III | MN 4 | 1 | 1 | 0 |
| 14 | අය වැය සහකාර | ආශ්‍රිත සේවා | I/II/III | MN 4 | 1 | 0 | 1 |
| 15 | සංවර්ධන නිලධාරී | ආශ්‍රිත සේවා | I/II/III | MN 4 | 56 | 50 | 6 |
| 16 | ගිණුම් සහකාර | ආශ්‍රිත සේවා | I/II/III | MN 4 | 1 | 0 | 1 |
| 17 | තාක්ෂණ නිලධාරී | තාක්ෂණ සේවය | I/II/III | MN 3 | 3 | 0 | 3 |
| 18 | රසායනාගාර කාර්මික | තාක්ෂණ සේවය | I/II/III | MN 3 | 3 | 0 | 3 |
| 19 | ජ්‍යෙෂ්ඨ පාලක (සත්ව) | තාක්ෂණ සේවය | I | MN 3 | 4 | 1 | 3 |
| 20 | ජ්‍යෙෂ්ඨ පාලක (මත්ස්‍ය) | තාක්ෂණ සේවය | I | MN 3 | 1 | 0 | 1 |
| 21 | රසායනාගාර කාර්මික (මත්ස්‍ය) | තාක්ෂණ සේවය | I/II/III | MN 3 | 1 | 0 | 1 |
| 22 | පාලක | තාක්ෂණ සේවය | I/II/III | MN 3 | 11 | 8 | 3 |
| 23 | රාජ්‍ය කළමනාකරණ සහකාර | ඒකාබද්ධ සේවය | I/II/III | MN 2 | 35 | 36 | -1 |
| 24 | ගාස්තු අයකිරීමේ සහකාර | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 16 | 14 | 2 |
| 25 | ප්‍රධාන ආරක්ෂක නිලධාරී | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 3 | 0 | 3 |
| 26 | චිත්‍ර ශිල්පී | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 2 | 2 | 0 |
| 27 | ගබඩා හා සැපයීම් සහකාර | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 1 | 1 | 0 |
| 28 | පරිගණක ක්‍රියාකරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 3 | 0 | 3 |
| 29 | නිවේදක | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 4 | 0 | 4 |
| 30 | දත්ත බැංකු ක්‍රියාකරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 1 | 0 | 1 |
| 31 | තොරතුරු නිලධාරී | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 3 | 0 | 3 |
| 32 | සහකාර පාලක | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 12 | 9 | 3 |
| 33 | ආරක්ෂක නියාමක (පිරිමි) | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 18 | 18 | 0 |

| අනු අංකය. | තනතුරු නාමය | සේවය | ශ්‍රේණිය/ පංතිය | වැටුප් පරිමාණය | ක.සේ.දෙ. වේ අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | ගණන | ගණන | |
| 34 | ආරක්ෂක නියාමක (කාන්තා) | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 3 | 3 | 0 |
| 35 | රසායනාගාර සහකාර | දෙපාර්තමේන්තු සේවය | I/II/III | MN 1 | 2 | 2 | 0 |
| ප්‍රාථමික මට්ටම | | | | | | | |
| 36 | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | I/II/III | PL 3 | 36 | 31 | 5 |
| 37 | වැඩ පරීක්ෂක | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 3 | 6 | 3 | 3 |
| 38 | විදුලි කාර්මික ශිල්පී | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 3 | 7 | 1 | 6 |
| 39 | රසායනාගාර සහකාර | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 3 | 1 | 2 |
| 40 | ප්‍රධාන සත්ව භාරකරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 3 | 2 | 1 |
| 41 | ප්‍රධාන අලි බලන්නා | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 2 | 2 | 0 |
| 42 | අලි බලන්නා | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 110 | 105 | 5 |
| 43 | ට්‍රැක්ටර් ක්‍රියාකරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 8 | 4 | 4 |
| 44 | යන්ත්‍ර ක්‍රියාකරු (බැකෝ) | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 3 | 1 | 2 |
| 45 | සත්ත්ව භාරකරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 95 | 91 | 4 |
| 46 | ජීවී ආහාර එකතු කරන්නා | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 2 | 1 | 1 |
| 47 | මත්ස්‍යාගාර උපස්ථායක | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 15 | 8 | 7 |
| 48 | කාර්මික | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 7 | 5 | 2 |
| 49 | වඩු කාර්මික | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 7 | 5 | 2 |
| 50 | පෙදරේරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 10 | 6 | 4 |
| 51 | පින්තාරුකරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 2 | 1 | 1 |
| 52 | ජලනල කාර්මික | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 5 | 3 | 2 |
| 53 | අරක්කැමි | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 7 | 3 | 4 |
| 54 | දම්වැල් කියත් ක්‍රියාකරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 8 | 5 | 3 |
| 55 | ජල පොම්ප ක්‍රියාකරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 2 | 1 | 1 | 0 |
| 56 | ආරක්ෂක නියාමක (පිරිමි) | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 1 | 33 | 32 | 1 |
| 57 | ආරක්ෂක නියාමක (කාන්තා) | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 1 | 12 | 10 | 2 |
| 58 | සුලු පරිපාලක (Overseer) | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 1 | 9 | 3 | 6 |
| 59 | උයන්කරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 1 | 25 | 25 | 0 |
| 60 | උද්‍යාන කම්කරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 1 | 109 | 67 | 42 |
| 61 | කාර්යාල කාර්ය සහයක | කාර්යාල සේවක සේවය | I/II/III | PL 1 | 12 | 8 | 4 |
| 62 | ගබඩාකරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 1 | 3 | 2 | 1 |
| 63 | රිය සහායක | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 1 | 5 | 5 | 0 |
| 64 | ගොවිපළ කම්කරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 1 | 14 | 6 | 8 |
| 65 | කම්කරු | දෙපාර්තමේන්තු සේවය | I/II/III | PL 1 | 106 | 106 | 0 |
| | **එකතුව** | | | | 881 | 712 | 169 |

- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව 2018 වර්ෂය තුළ අලි බලන්නා තනතුර සඳහා සේවකයන් 11ක් බඳවා ගන්නා ලදී. මීට අමතරව දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරී තනතුරේ පුරප්පාඩු 05ක්, රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරට අදාළ පුරප්පාඩු 16ක් සහ රියදුරු තනතුරේ පුරප්පාඩු 03ක් 2018 වසර තුළදී සම්පූර්ණ වී ඇත.

  තවද, පින්නවල අලි අනාථාගාරය සහ පින්නවල සත්වෝද්‍යානය යන ආයතන දෙක සඳහා පුරප්පාඩුව පැවති ගණකාධිකාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික ගණකාධිකාරීවරයෙකු බඳවාගෙන ඇත.

*ක.සේ.දෙ - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

- සටහන 01: ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන.



# 2 මෙහෙයුම් ඒකක

## 2.1 ප්‍රධාන කාර්යාලය

2017 ජූලි මස 27 දින සිට එතෙක් දෙහිවල සත්ව උද්‍යානය තුල ස්ථාපිතව පැවති ප්‍රධාන කාර්යාලය ටෙන්ඩර් කැඳවීම තුලින් තෝරා ගන්නා ලද 251/2ඒ, 251/2බී, කොළඹ පාර, වත්තෙ ගෙදර හන්දිය, මහරගම යන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලේ ස්ථාපිත කරන ලදී.

අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු දෙපාර්තමේන්තුවේ පරිපාලනය සහ මූල්‍ය පරිපාලනයට අදාළ ජොෂ්ඨ මට්ටමේ නිලධාරීන් 09ක් තෘතීය මට්ටමේ නිලධාරීන් 01ක් ද ඇතුළුව සහය කාර්යය මණ්ඩලයක් ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත ව සේවය කරනු ලබයි.

## 2.2 දෙහිවල ජාතික සත්වෝද්‍යානය

ජර්මන් ජාතික ජෝන් හාගෙන්බර්ග් මහතා විසින් පුද්ගලික වන සත්ත්ව එකතුවක් ලෙස 1920 දශකයේ පෙර භාගයේ දී අක්කර 11ක භූමි භාගයක් සහිත ව ආරම්භ කරන ලදී. එය 1936 වර්ෂයේ දී රජයට පවරා ගන්නා ලද අතර මේ වන විට අක්කර 23 ක භූමි භාගයක් පුරා පැතිරී ඇත.

දේශීය හා විදේශීය ක්ෂීරපායී, පක්ෂි, උරග සහ මත්ස්‍ය විශේෂ රාශියකින් සමන්විත අධ්‍යාපනික වටිනාකමකින් යුතු සත්ත්ව එකතුවක් දෙහිවල සත්වෝද්‍යානය සතුව පවතී.

දෙහිවල ජාතික සත්වෝද්‍යානය 2018 වර්ෂයේ නැරඹීමට පැමිණි දේශීය නරඹන්නන් සංඛ්‍යාව 1,537,694ක් සහ විදේශීය නරඹන්නන් සංඛ්‍යාව 30,902කි. ඒ අනුව, සමස්ත නරඹන්නන් සංඛ්‍යාව 1,568,596ක් වේ.

## 2.3 පින්නවල අලි අනාථාගාරය

පින්නවල අලි අනාථාගාරය වර්ෂ 1975 දී රඹුක්කන-පින්නවල අක්කර 25ක භූමි ප්‍රදේශයක් තුළ අනාථ වූ අලින් පස් දෙනෙකුගෙන් යුතු ව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය කරන ලදී. 1982 දී පින්නවල අලි අනාථාගාරයේ පාලනය ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතට පවරා ගන්නා ලදී.

අලි ඇතුන් 89 දෙනෙකු සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පින්නවල අලි අනාථාගාරය තුල රැකවරණය ලබා දී ඇත. පින්නවල අලි අනාථාගාරය ආරම්භයේ සිට මේ දක්වා, අලි අනාථාගාරය තුළ අලි පැටවුන් 70ක් උපත ලබා ඇති අතර 2018 වර්ෂයේ දී උපත් වාර්තා වී නැත.

පින්නවල අලි අනාථාගාරය 2018 වර්ෂයේ නැරඹීමට පැමිණි දේශීය නරඹන්නන් සංඛ්‍යාව 588,266ක් සහ විදේශීය නරඹන්නන් සංඛ්‍යාව 337,662කි. ඒ අනුව, සමස්ත නරඹන්නන් සංඛ්‍යාව 925,928ක් වේ.

## 2.4 පින්නවල සත්වෝද්‍යානය

පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමත් විවෘත සත්වෝද්‍යාන සංකල්පය නරඹන්නන්ට ලබා දීමත් අරමුණු කර ගෙන අක්කර 54ක භූමි ප්‍රමාණයක විවෘත සත්වෝද්‍යානයක් ලෙස පින්නවල සත්වෝද්‍යානය ආරම්භ කරන ලදී. මෙම සත්වෝද්‍යානයෙන් කුඩු හෝ කුඩා සත්ත්ව අරණ වලට වඩා නිදහස් ව ජීවත් විය හැකි ඉඩකඩක් සතුන්ට ලබා දීමටත් නරඹන්නන් සඳහා වඩා වැඩි නිරීක්ෂණ පහසුකම් ලබා දීමටත් අදහස් කරයි.

මෙහි ශ්‍රී ලංකා දිවි අරණ, මිශ්‍ර මුව අරණ, වලස් අරණ, කිඹුල් අරණ යන සත්ත්ව අරණ ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රදර්ශනය සඳහා විවෘතව ඇත. ප්‍රදර්ශනය කටයුතු 2015.04.17 දින සිට ආරම්භ කරන ලදී.

2018 වර්ෂයේ දේශීය නරඹන්නන් 301,699ක් සහ විදේශීය නරඹන්නන් 3,788ක් පින්නවල සත්වෝද්‍යානය නැරඹීමට පැමිණ ඇත. ඒ අනුව, සමස්ත නරඹන්නන් සංඛ්‍යාව 305,487ක් වේ.

## 2.5 හම්බන්තොට සෆාරි උද්‍යානය

නව සත්වෝද්‍යාන සංකල්ප මත අක්කර 500ක භූමි ප්‍රමාණයක ඉදි කෙරෙන සෆාරි උද්‍යානය ප්‍රථම අදියර 2016 මාර්තු 28 දින ආරම්භ විය. සිංහ කලාපය, ලෝක සත්ත්ව කලාපය හා ආසියානු අලි ඇතුන් සිටින කලාපය ප්‍රථම අදියර තුලින් මහජනයාට විවෘත විය. ඉදි කෙරෙමින් පවතින සත්ත්ව කලාප අතර අප්‍රිකානු ශාක භක්ෂක සත්ත්ව කලාපය, බෙංගාල ව්‍යාඝ්‍ර කලාපය, ආසියානු සත්ත්ව කලාපය, ශ්‍රී ලංකා දිවි කලාපය, ඕස්ට්‍රේලියානු කලාපය, චීටා සතුන් සහිත කලාපය හා චිම්පන්සි කලාපය යන සත්ත්ව කලාප වේ.

තවද පක්ෂීන්, බළල් පවුලේ කුඩා සතුන්, වඳුරු විශේෂ, කුඩා ශාක භක්ෂකයින් සහ සමනළ උයනක් සහිත අක්කර 35ක භූමි ප්‍රමාණයකින් යුතු කුඩා සෆාරි උද්‍යානයක් ද , අක්කර 10ක භූමි ප්‍රමාණයකින් යුතු උරග උයනක් සහ අක්කර 10ක භූමි ප්‍රමාණයකින් යුතු සත්ව සංරක්ෂණය සඳහා ම වෙන් වූ සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයක් ද ඉදි වෙමින් පවතී.

ශ්‍රී ලාංකිකයින්ට සෆාරි සංචාරක අත්දැකීමක් ලබා දෙමින් පාරිසරික සංචරණය ප්‍රවර්ධනයට දායකවීම, සත්වෝද්‍යාන සත්ත්ව විශේෂ සඳහා අභිජනන වැඩසටහන් පැවැත්වීම, සත්ත්ව සංරක්ෂණ වැඩසටහන් තුළින් හුදකලා සත්ත්ව ගහන වල ජාන සංචිතය වැඩිදියුණු කිරීම මෙහි මූලික පරමාර්ථ අතර වේ.

2018 වර්ෂයේ දේශීය නරඹන්නන් 296,576ක් සහ විදේශීය නරඹන්නන් 754ක් හම්බන්තොට සෆාරි උද්‍යානය නැරඹීමට පැමිණ ඇත. ඒ අනුව, සමස්ත නරඹන්නන් සංඛ්‍යාව 297,330ක් වේ.

## 2.6 ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ

දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ශාක භක්ෂක සතුන් සඳහා අවශ්‍ය නැවුම් සහ පෝෂණ ගුණයෙන් යුතු ආහාර වලින් කොටසක් සැපයීම පිණිස මෙම ගොවිපළ 1997 වර්ෂයේ දී හොරණ- ගෝනපොල ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තුල ස්ථාපිත කරන ලදී. 2018 වර්ෂය තුළ රු.මි.4.76ක් වටිනා සත්ත්ව ආහාර ප්‍රමාණයක් දෙහිවල සත්වෝද්‍යානය වෙත සපයන ලද අතර අතිරික්ත සතුන් හා අතිරික්ත බෝග අලෙවි කිරීමෙන් ලද ආදායම ඇතුළුව 2018 වසර තුළ රු.මි.4.79ක සමස්ත ආදායමක් ලබා ඇත.

ගෝනපොල ගොවිපළ සත්වෝද්‍යාන අරමුණු සඳහා වඩාත් ඵලදායක ලෙස දායක කර ගනිමින් දෙහිවල සත්වෝද්‍යානයේ සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ගෝනපොල ගොවිපළ පරිශ්‍රය තුළ මේ වන විට ක්‍රියාත්මක ව පවතී.

# 3 සත්ත්ව සංරක්ෂණය සහ අභිජනනය

## 3.1 සත්ත්ව එකතුව

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරමාර්ථ අතරින් පළමු ස්ථානය හිමි වන්නේ සත්ත්ව සංරක්ෂණය හා අභිජනනය උදෙසා ය. එම පරමාර්ථය ඉටු කර ගැනීම උදෙසා, දැනට ලෝකයේ වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇති සතුන් ආරක්ෂා කර ගනිමින් 2018 වර්ෂය තුළ සත්ත්ව විශේෂ 246 කට අයත් සතුන් 5922ක් සඳහා නිවහන සපයනු ලැබීය. දෙපාර්තමේන්තුව සතු එක් එක් මෙහෙයුම් ඒකක යටතේ වර්ෂය තුළ නිවහන සපයනු ලැබූ සත්ත්ව එකතුව පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

මෙයට අමතරව නිදහසේ වෙසෙන සමනළ හා අනෙකුත් අපෘෂ්ඨවංශි විශේෂ සහ නිදැල්ලේ වෙසෙන කුරුලු විශේෂ රාශියක් මෙම උද්‍යාන තුල හඳුනා ගත හැකිය.

*වගුව 03: 2018.12.31 දිනට ජාතික සත්වෝද්‍යානය දෙපාර්තමේන්තුව සතු සත්ත්ව එකතුව*

| සත්ව වර්ගීකරණය | | විශේෂ/පවුල් | සත්ත්වයින් ප්‍රමාණය |
|---|---|---|---|
| දෙහිවල ජාතික සත්වෝද්‍යානය | | | |
| 1 | ක්ෂීරපායී | 63 | 313 |
| 2 | පක්ෂි | 78 | 809 |
| 3 | උරග | 33 | 167 |
| 4 | මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන් | 68 | 3151 |
| එකතුව | | **242** | **4440** |
| පින්නවල අලි අනාථාගාරය | | | |
| **1** | **ක්ෂීරපායී - ආසියානු අලියා** | 01 | 86 |
| එකතුව | | **01** | **86** |
| පින්නවල සත්වෝද්‍යානය | | | |
| 1 | ක්ෂීරපායී | 12 | 136 |
| 2 | පක්ෂි | 06 | 34 |
| 3 | උරග | 03 | 09 |
| එකතුව | | **21** | **179** |
| හම්බන්තොට සෆාරි උද්‍යානය | | | |
| 1 | ක්ෂීරපායී | 35 | 303 |
| 2 | පක්ෂි | 16 | 61 |
| 3 | උරග | 04 | 694 |
| එකතුව | | **55** | **1058** |
| ගෝනපොල - ගොවිපළ | | | |
| 1 | ක්ෂීරපායී | 02 | 11 |
| 2 | පක්ෂි | 05 | 148 |
| එකතුව | | **07** | **159** |
| **ජා.ස.දෙ. සතු සමස්ත සත්ත්ව එකතුව** | | **246** | **5922** |

## 3.2 සත්ත්ව අභිජනනය

විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව අභිජනන වැඩසටහන් දියත් කරමින් සත්ත්ව ගහනය වැඩි කිරීමට දායක වන ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව 2018 වර්ෂය තුළ දී විවිධ සත්ත්ව විශේෂ වලට අයත් සතුන් 125ක් (මත්ස්‍ය විශේෂ හා නිදහසේ ජීවත් වන පක්ෂි විශේෂ හැර) සාර්ථකව බිහි කිරීමට හැකියාව ලැබී ඇත.

| *වගුව 04: 2018. වසර තුළ (2018.12.31 දිනට) ජාතික සත්වෝද්‍යානය දෙපාර්තමේන්තුව තුළ උපත ලද සතුන්* | | | |
|---|---|---|---|
| **සත්ව වර්ගීකරණය** | | **විශේෂ/පවුල්** | **සත්ත්වයින් ප්‍රමාණය** |
| **දෙහිවල ජාතික සත්වෝද්‍යානය** | | | |
| 1 | ක්ෂීරපායී | 13 | 30 |
| 2 | පක්ෂි | 04 | 29 |
| 3 | උරග | 01 | 07 |
| එකතුව | | **18** | **66** |
| **පින්නවල අලි අනාථාගාරය** | | | |
| 1 | ක්ෂීරපායී - ආසියානු අලියා | | 2018 වසර තුළ කිසිදු අලි උපතක් වාර්තා වී නැත. |
| එකතුව | | | |
| **පින්නවල සත්වෝද්‍යානය** | | | |
| 1 | ක්ෂීරපායී | 07 | 24 |
| එකතුව | | **07** | **24** |
| **හම්බන්තොට සෆාරි උද්‍යානය** | | | |
| 1 | ක්ෂීරපායී | 08 | 21 |
| එකතුව | | **08** | **21** |
| **ගෝනපොල - ගොවිපළ** | | | |
| 1 | ක්ෂීරපායී | 01 | 01 |
| 2 | පක්ෂි | 01 | 20 |
| එකතුව | | **01** | **21** |
| **ජා.ස.දෙ.වේ 2018 වසර තුළ (*2018.12.31 දිනට*) උපත ලද සමස්ත සත්ත්ව එකතුව** | | | **132** |

## 3.3 2018 වර්ෂයේ සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිල දී ගැනීම

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සතුන් ලබාගැනීමේ ප්‍රධානතම මාර්ගය විදේශීය සත්වෝද්‍යාන සමග සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මේ මගින් දෙපාර්තමේන්තුවේ සත්ත්ව විශේෂ සංඛ්‍යාව ඉහල නැංවීම, නව ජාන එකතු කිරීම තුලින් අභිජනන වැඩසටහන් විධිමත් කර නිරෝගී සත්ත්ව පරම්පරාවක් ඇති කිරීම අරමුණු කරනු ලබයි.

2018 වර්ෂයේ දී (2018.12.31 දිනට) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ සත්ත්ව හුවමාරු වැඩසටහන් පහත දැක්වේ.

*වගුව 05: 2018 වසරේ සත්ත්ව හුවමාරු වැඩසටහන්*

| අපනයනය කරන ලද සතුන් | | | | |
|---|---|---|---|---|
| සත්ව වර්ගය | ප්‍රමාණය | | අපනයනය දිනය | සත්වෝද්‍යානය සහ රට |
| | ගැහැණු | පිරිමි | | |
| ඇනකොන්ඩා | 01 | 01 | 2018.04.28 | Sri Chamarajendra Zoological Gardens, Mysore, India |
| **ආනයනය කරන ලද සතුන්** | | | | |
| සත්ව වර්ගය | ප්‍රමාණය | | ආනයනය දිනය | සත්වෝද්‍යානය සහ රට |
| | ගැහැණු | පිරිමි | | |
| කැන්ගරු | 03 | 01 | 2018.03.15 | Nagoya Higashiyama Zoo, Japan |

ඉහත සත්ත්ව හුවමාරු වැඩසටහන් වලට අමතරව දේශීය සැපයුම්කරුවන් වෙතින් ලබා ගත හැකි කුරුලු විශේෂ ලබාගැනීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගෙන සුදුසු පක්ෂීන් මිලට ගැනීම සඳහා මේ වන විට ඇණවුම් ලබා දී ඇත.

## 4 අධ්‍යාපනික, පර්යේෂණ, විශේෂ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන්

විතැන් සංරක්ෂණ මධ්‍යස්ථානයක් වශයෙන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විවිධ අධ්‍යාපනික වැඩසටහන් පවත්වමින් සත්ත්ව සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ සහ සත්ත්ව විශේෂ පිළිබඳ තොරතුරු මහජනතාව වෙත ලබා දෙයි. තවද එක් එක් මෙහෙයුම් ආයතන විසින් 2018 වර්ෂය තුළ දී විවිධ වූ විශේෂාංග පවත්වමින් ද දැයේ දරුවන් සඳහා අධ්‍යාපනික දැනුමක් මෙන් ම විනෝද වීමේ අවස්ථාව ද ලබා දෙන ලදී.

2018 වර්ෂය තුළ එක් එක් මෙහෙයුම් ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපනික සහ වෙනත් විශේෂ වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 4.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය

❖ **අධ්‍යාපනික වැඩසටහන්**

*වගුව 06: 2018 වර්ෂයේ අධ්‍යාපනික වැඩසටහන් - දෙහිවල සත්වෝද්‍යානය*

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම්/ ඉලක්කගත කණ්ඩායම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | දේශන | විශ්ව විද්‍යාල සිසුන් සඳහා දේශන | 09 |
| | | සේවක මහතුන් සඳහා දේශන | 09 |
| | | පාසල් ළමුන් සඳහා | 38 |
| | | වෙනත් ආයතන සඳහා | 03 |
| 02 | ක්ෂේත්‍ර චාරිකා | දෙහිවල සත්වෝද්‍යානයේ සේවක මහතුන් සඳහා ක්ෂේත්‍රයේ සතුන් පිළිබඳව ඇති දැනුම වැඩිදියුණු කිරීමට විල්පත්තුව වනෝද්‍යානය තුළ ක්ෂේත්‍ර අධ්‍යානය. | 01 |
| 03 | මාර්ගෝපදේශ වැඩසටහන් | පාසල් ළමුන් සඳහා. | 10 |
| 04 | ජංගම ප්‍රදර්ශන ඒකකය | ප්‍රදර්ශන | 32 |
| 05 | විස්තර කථන වැඩසටහන් | නරඹන්නන් සඳහා | 130 |
| 06 | පශු වෛද්‍ය අංශයේ පුහුණු වැඩසටහන් | සීමාවාසික පශු වෛද්‍ය පුහුණු | 07 |
| | | පශු වෛද්‍ය සිසුන් සඳහා වන ආයතනික පුහුණුව | 05 |

*වගුව 07 : ස්වේච්ඡා සේවක වැඩසටහන 2018 - දෙහිවල සත්වෝද්‍යානය*

| අනු අංකය | ස්වේච්ඡා සේවක කාණ්ඩය | පැමිණි ගණන | ආදායම (රුපියල්) |
|---|---|---|---|
| 01 | දේශීය | 07 | 31,000.00 |
| | **මුළු සංඛ්‍යාව** | 07 | 31,000.00 |

❖ **විශේෂාංග සහ විශේෂ දින සැමරුම්**

- සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් අලි ඇතුන් උදෙසා හිස තෙල් ගෑමේ චාරිත්‍රානුකූල උත්සවය.
- 2018 ඔක්තෝබර් 01 ලෝක ළමා දිනය වෙනුවෙන් ළමුන් සඳහා අධ්‍යාපනික හා විනෝදාත්මක වැඩසටහන් පැවැත්වීම.
- ජෛව විවිධත්ව දිනය සැමරීමේ උත්සවය.

## 4.2 පින්නවල අලි අනාථාගාරය

❖ අධ්‍යාපනික වැඩසටහන්

2018 වර්ෂයේ පින්නවල අලි අනාථාගාරය විසින් ආසියානු අලි ඇතුන් සම්බන්ධ තොරතුරු, අලි ඇතුන් සංරක්ෂණය පිළිබඳව හා පින්නවල අලි අනාථාගාරයේ කාර්ය භාරය පිළිබඳව තොරතුරු දෙස් විදෙස් සංචාරකයින් හට ලබා දීම උදෙසා වැඩසටහන් ගණනාවක් සංවිධානය කර ක්‍රියාත්මක කර ඇත. එම වැඩසටහන් පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

*වගුව 08 : 2018 වර්ෂයේ පවත්වන ලද අධ්‍යාපනික වැඩසටහන් - පින්නවල අලි අනාථාගාරය*

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | දේශන | විශ්ව විද්‍යාල සිසුන් සඳහා | 11 |
| | | පාසල් ව්‍යාපෘති සඳහා දැනුවත් කිරීම් | 03 |
| | | පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් | 17 |
| | | පෙර පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් | 03 |
| | | සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ( ඩෙංගු මදුරුවන් වැළැක්වීම . මැලේරියා උණ සහ එය ව්‍යාප්ත වීමේ අවධානම, මත්ද්‍රව්‍ය වැළැක්වීමේ වැඩසටහන, බෝනොවන රෝග වැළැක්වීමේ වැඩසටහන, ආහාර හා පෝෂණය පිළිබඳව දැනුවත් කිරීමේ දේශනය ) | 05 |
| | | දේශීය නරඹන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 30 |
| | | විදේශීය නරඹන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 61 |
| 2 | සේවක පුහුණු වැඩසටහන් | උද්‍යාන පුහුණු හා අලංකරණය ( ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව) | 02 |
| | | සේවක ආකල්ප හා නායකත්ව නේවාසික දෙදින පුහුණු වැඩසටහන ( වයඹ පුහුණු මධ්‍යස්ථානය) | 01 |
| | | ප්‍රාථමික සේවකයින් සඳහා වන දෙමළ භාෂා පුහුණු වැඩසටහන් | 02 |
| | | ශාක කප්පාදුව, ප්‍රතිකාරය සහ උද්‍යාන නඩත්තුව පිළිබඳ පුහුණු පාඨමාලාව ( ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ) | 10 |
| | | Internal training program for veterinary surgeons on Endoscopy | 02 |
| 3 | ප්‍රදර්ශන | ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කර දැනුවත් කිරීමේ කාර්යයන් සිදු කිරීම | 03 |
| 4 | පශු වෛද්‍ය අංශයේ පුහුණු වැඩසටහන් | සීමාවාසික පශු වෛද්‍ය පුහුණු | 04 |
| | | විශ්ව විද්‍යාල සිසුන් සඳහා වන ආයතනික පුහුණුව | 07 |

*වගුව 09 : ස්වේච්ඡා සේවක වැඩසටහන 2018 - පින්නවල අලි අනාථාගාරය*

| අනු අංකය | ස්වේච්ඡා සේවක කාණ්ඩය | පැමිණි ගණන | ආදායම (රුපියල්) |
|---|---|---|---|
| 01 | දේශීය | 04 | 7,300.00 |
| 02 | විදේශීය | 76 | 906,738.00 |
| **මුළු සංඛ්‍යාව** | | **80** | **914,038.00** |

❖ **පර්යේෂණ**

"අලි ඇතුන්ගේ දෛනික ආහාර සඳහා තෘණ වර්ග හඳුන්වා දීමේ ශක්‍යතාවය සොයා බැලීම පිළිබඳ පර්යේෂණය"(2018)

❖ **විශේෂාංග සහ විශේෂ දින සැමරුම්**

- 2018 පෙබරවාරි 16 වන දින පින්නවල අලි අනාථාගාරයේ 43 වන සංවත්සරික දිනය වෙනුවෙන් "කුංචනාදය 2018" නමින් විශේෂිත උත්සවයක් පැවැත්වීම.
- 2018 පෙබරවාරි 17 වන දින පින්නවල අලි අනාථාගාරයේ අලි ඇතුන්ට සහ කාර්ය මණ්ඩලයට සෙත් පතා කිරිඅම්මාවරු 14 විෂයෙහි කිරි අම්මා වරුන්ගේ දානයක් පැවැත්වීම.

- 2018 අප්‍රේල් මස 16 වැනි දින පින්නවල අලි අනාථාගාරයේ අලි ඇතුන්ගේ හිස තෙල් ගෑමේ මහෝත්සවය පැවැත්වූ අතර 2018 අප්‍රේල් මස 30 වැනි දින සමස්ථ සේවක මණ්ඩලය හා එදින පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් නරඹන්නන් සහභාගීත්වයෙන් බක් මහ උළෙලක් සංවිධානය කිරීම.
- 2018 ජූනි මස 05 වැනිදාට යෙදුනු "ලෝක පරිසර දිනය"ට සමගාමීව රඹුක්කන ප්‍රදේශයෙ පාසල් ළමා කණ්ඩායම් සහභාගී කරගනිමින් අධ්‍යාපනික වැඩසටහනක් සහ නිදහස් අලි සැරිසරණ පෙදෙසේ රුක් රෝපණ වැඩසහනක් ක්‍රියාත්මක කිරීම.
- 2018 අගෝස්තු මස 12 වැනිදාට යෙදුණු "ලෝක අලි දිනය" ට සමගාමීව පින්නවල අලි අනාථාගාරය 2018.08.12 වැනි දින අලි ඇතුන් සංරක්ෂණය පිළිබඳව කරුණු ඇතුලත් පොත් සළකුණු නරඹන්නන්ට බෙදා දීමේ වැඩසටහනක් , අලි ඇතුන්ට හා සේවකයින් සඳහා ආශිර්වාදාත්මක පිරිත් සජ්ඣායනයක් සහ අලි ඇතුන් සඳහා වන පළතුරු දානමය පිංකමක් සංවිධානය කරන ලදි. ලෝක අලි දිනයට සමගාමීව 2018.08.14 වන දින රඹුක්කන ප්‍රාදේශිය සභා පෙර පාසලේ සිසු සිසුවියන් සඳහා අලි ඇතුන්ගේ සංරක්ෂණ වැදගත්කම අවධාරණය වන පරිදි අධ්‍යාපනික වැඩසටහනක් පවත්වන ලදී.
- 2018 ඔක්තොම්බර් 01 දා ලෝක ළමා දිනය වෙනුවෙන් ළමුන් සඳහා අධ්‍යාපනික හා විනෝදාත්මක වැඩසටහන් පැවැත්වීම.

❖ **සේවක සුබ සාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්**

- පින්නවල අලි අනාථාගාරයේ සේවක ක්‍රිඩා කුසලතා නන්වාලීම සඳහා ඒක එක් අංශ වලින් සැදුම්ලත් කණ්ඩායම් අතර අත් පන්දු තරගාවලියක් පැවැත්වීම.
- සමස්ථ කාර්ය මණ්ඩය වෙනුවෙන් බෝ නොවන රෝග පිළිබඳව වෛද්‍ය කඳවුරක් පැවැත්වීම.
- මැලේරියා රෝගයෙන් වැළැක්වීම සඳහා සමස්ථ කාර්ය මණ්ඩලය වෙත විශේෂිත මදුරුවන් පලවාහැරීමේ ශක්‍යතාවයක් ඇති මදුරු දැල් බෙදා දීමේ වැඩසටහන.
- පින්නවල අලි අනාථාගාරයේ සේවකයින්ගේ අතිරික්ත කාබනික කෘෂි නිෂ්පාදන සහනදායි මිලට සේවක මණ්ඩලය වෙත අලෙවිකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරිම.
- සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වන "ක්ෂය රෝගය පරීක්ෂා කිරීමේ වෛද්‍ය සායනයක්" කෑගල්ල ශික්ෂණ රෝහල සමඟ ඒකාබද්ධව සංවිධානය කිරීම.

## **4.3** පින්නවල සත්වෝද්‍යානය

❖ **අධ්‍යාපනික වැඩසටහන්**

2018 වර්ෂය තුළ පින්නවල සත්වෝද්‍යානය විසින් විවිධ අධ්‍යාපනික වැඩසටහන් පවත්වමින් සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කර ඇත.

*වගුව 10 : 2018 වර්ෂයේ අධ්‍යාපනික වැඩසටහන් - පින්නවල සත්වෝද්‍යානය*

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | වැඩමුළු | 2018.06.16 වන දින කෑගලු විද්‍යාලයේ ඡායා රූප සංගමයේ ළමුන් 64 දෙනෙකුගේ සහභාගීත්වයෙන්. | 01 |
| 02 | ප්‍රදර්ශන සඳහා සහභාගීවීම් | ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කර දැනුවත් කිරීමේ කාර්යයන් සිදු කිරීම | 04 |

❖ **විශේෂාංග සහ විශේෂ දින සැමරුම්**

- 2018.03.06 වන දින පින්නවල සත්වෝද්‍යානයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා මැලේරියා රෝගීන් හඳුනා ගැනීම වෙනුවෙන් රුධිර පටල පරීක්ෂා කිරීමේ වෛද්‍ය සායනයක් පවත්වන ලදී.
- 2018.01.01 වන දින පින්නවල සත්වෝද්‍යානයට හා කාර්ය මණ්ඩලයට සෙත් පතා කිරි උතුරුවා සෙත් ශාන්තියක් ප්‍රාර්ථනා කරන ලදී. එදින ප.ව 4.00ට ධර්ම දේශනයක් පවත්වන ලද අතර ප.ව 8.00 සිට සර්ව රාත්‍රික පිරිත් දේශනයක් පවත්වන ලදී.
- 2018.01.03 වන දින පින්නවල සත්වෝද්‍යානයේ සේවය කරන සේවක සේවිකාවන්ගේ ආරක්ෂාව හා සත්වෝද්‍යානයේ දියුණුව වෙනුවෙන් දේවාසිරි පැතීම සඳහා වාර්ෂිකව සංවිධානය කරනු ලබන අලුත් නුවර ශ්‍රී දැඩිමුණ්ඩ දේවාලයේ විශේෂ දේව පූජා පිංකම , ප.ව 7.00 ට අලුත් නුවර දැඩිමුණ්ඩ දේවාලයේදී පින්නවල සත්වෝද්‍යානයේ සේවක සේවිකාවන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- ජගත් පරිසර දින වැඩසටහන 2018.06.05 වන දින පාසල් ළමුන් 150 කගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- ශ්‍රී ලංකා තරුණ සත්ත්වවේදින්ගේ සංගමයේ සහභාගීත්වයෙන් 2018.06.14 වන දින Regarding Public Relation Day At Pinnawala Zoo වැඩමුළු පාසල් ළමුන් 77 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- ජාතික මත්ද්‍රව්‍ය නිවාරන සතිය නිමිති කර ගෙන පින්නවල සත්වෝද්‍යානයේ සේවකයින් 92 ක් සහ සත්වෝද්‍යානය නැරඹීමට පැමිණෙන නරඹන්නන් 2500 දෙනෙකු 2018.06.26 සිට 2018.07.02 දින දක්වා දැනුවත් කරන ලදී.
- පින්නවල ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් ගොවීන් 50 දෙනකුගේ සහභාගීත්වයෙන් ජගත් සර්පයින් සුරැකීමේ දින වැඩමුළුව 2018.07.16 වන දින පවත්වන ලදී.
- දරු දැරියන් 2500 කගේ සහභාගීත්වයෙන් 2018.10.01 ලෝක ළමා දිනය සමරන ලදී.
- 2018.11.02 වන දින කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් ව්‍යාපාර සංවර්ධන අංශයේ නිලධාරීන් 29 දෙනෙකු සහ ආර්ථික සංවර්ධන අංශයේ නිලධාරීන් 167 දෙනෙකුගේ සහභාගීත්වයෙන් "වටමඩල" වැඩසටහන පවත්වන ලදී.
- 2018.11.05 වන දින කෑගලු දිස්ත්‍රික් බාලදක්ෂයින් 152 දෙදෙනෙකුගේ සහභාගීත්වයෙන් සත්ව සංරක්ෂණ වැඩසටහනක් පවත්වන ලදී.
- 2018.11.08 වන දින කෑගලු දිස්ත්‍රික් පෝතක බාලදක්ෂයින් 193 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සත්ව සංරක්ෂණ වැඩසටහනක් පවත්වන ලදී.
- 2018.12.14 වන දින" වන දිවිය" අතිරේකයේ චිත්‍ර වැඩමුළුව පවත්වන ලදී.
- 2018.12.12 වන දින ඇනිමල් ප්ලැනට් නාලිකාවේ රූගත කිරීම් සිදු කිරීම .
- 2018.12.19 සිට 21 වන දින දක්වා "සොබාධාරා" රූපවාහනී වැඩසටහනේ උණහපුළුවා පිළිබඳ වාර්තා වැඩසටහන රූගත කිරීම.

## 4.4 හම්බන්තොට සෆාරි උද්‍යානය

❖ අධ්‍යාපනික වැඩසටහන්

පාරිසරික සංචරණයේ පළමු දේශීය අත්දැකීම ශ්‍රී ලාංකිකයින්ට ලබා දෙන හම්බන්තොට සෆාරි උද්‍යානය එහි කාර්යභාරය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් 2018 වසර තුළ අවධානය යොමු කරන ලදී.

*වගුව 11 : 2018වර්ෂයේ අධ්‍යාපනික වැඩසටහන් - හම්බන්තොට සෆාරි උද්‍යානය*

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | දේශන | මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා පරිසර සංරක්ෂණය සහ සෆාරි උද්‍යානය පිළිබඳව හඳුන්වාදීමේ අධ්‍යාපනික වැඩසටහන. | 01 |
| | | විදේශීය සංචාරකයන් සඳහා සර්පයින් හඳුනා ගැනීම සහ හැසිරවීම පිළිබඳව අධ්‍යාපනික වැඩසටහන. | 01 |
| 3. | ප්‍රදර්ශන සඳහා සහභාගීවීම් | ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කර දැනුවත් කිරීමේ කාර්යයන් සිදු කිරීම | 02 |

❖ විශේෂාංග සහ විශේෂ දින සැමරුම්

- සෆාරි උද්‍යානය විවෘත කර දෙවසරක් පිරීම නිමිත්තෙන් 2018.03.27 දින සෙත් පිරිත් සජ්ඣායනාව පැවැත්වීම සහ 2018.03.28 දින සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම.
- 2018 ජූනි මස 05 වැනිදාට යෙදුනු "ලෝක පරිසර දිනය"ට සමගාමීව ආයතනයේ කාර්යමණ්ඩලය සහභාගිත්වයෙන් සහ පෙර පාසල් දරුවන්ගේ සහභාගිත්වයෙන් රුක් රෝපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රදේශයේ පෙර පාසල් තුනක් සඳහා 2018.11.20 දින නොමිලේ උද්‍යානය නැරඹීමට අවස්ථාව ලබාදීම සහ කාර්යමණ්ඩලයේ වියදමින් දිවා ආහාරය ලබාදීම සහ පාසල් උපකරණ බෙදාදීම.

## 4.5 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන්

2018 වසර තුළ විවිධ බාහිර ආයතන හරහා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය (සියලුම උප ආයතන ඇතුළුව) වෙත දේශීය සහ විදේශීය වශයෙන් ලබාදෙන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

❖ **පුහුණු වැඩසටහන් - දේශීය**

*වගුව 12 : 2018 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන ලද දේශීය පුහුණු වැඩසටහන්*

| අනු අංකය | පුහුණු පාඨමාලාව | පුහුණුව පවත්වන ලද ආයතනය | සහභාගි වූ නිලධාරින් සංඛ්‍යාව | උප ආයතනය | වැය කළ මුදල (රු) |
|---|---|---|---|---|---|
| 01 | තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 | ප්‍රධාන කාර්යාලය | 50,000.00 |
| 02 | One day Seminar on Interim Valuation & Final Accounts | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 02 | ප්‍රධාන කාර්යාලය | 7000.00 |
| 03 | රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර පරිහරණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | පින්නවල අලි අනාථාගාරය | 6000.00 |
| 04 | නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | දෙහිවල සත්වෝද්‍යානය | 12,000.00 |
| | | | 01 | පින්නවල අලි අනාථාගාරය | |
| | | | 02 | ප්‍රධාන කාර්යාලය | |
| 05 | සහායක කාර්යමණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | පින්නවල අලි අනාථාගාරය | 6000.00 |
| 06 | Financial Regulations in the Public Sector | මිලෝඩා ආයතනය | 02 | ප්‍රධාන කාර්යාලය | 23,000.00 |
| 07 | Advanced MS Excel skills | මිලෝඩා ආයතනය | 03 | ප්‍රධාන කාර්යාලය | 34,500.00 |
| 08 | මූලික බදුකරණය | ප්‍රාග් ආයතනය | 01 | ප්‍රධාන කාර්යාලය | 7000.00 |
| 09 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය | නිපුණතා සංවර්ධන අරමුදල | 01 | ප්‍රධාන කාර්යාලය | 8500.00 |
| 10 | Diploma in Public Procurement & contract Administration | මිලෝඩා ආයතනය | 01 | ප්‍රධාන කාර්යාලය | 100,000.00 |
| 11 | Basic Report Writing Skills | මිලෝඩා ආයතනය | 01 | පින්නවල අලි අනාථාගාරය | 16,500.00 |
| 12 | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායි ලෙස පවත්වාගෙන යාම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | පින්නවල අලි අනාථාගාරය | 3000.00 |
| 13 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | ප්‍රධාන කාර්යාලය | 8500.00 |
| 14 | Certificate in English for office Management | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | ප්‍රධාන කාර්යාලය | 39,000.00 |
| | | | 02 | පින්නවල සත්වෝද්‍යානය | |
| 15 | Database Management in MS Access | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 | ප්‍රධාන කාර්යාලය | Free |
| 16 | Advanced Excel | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 | ප්‍රධාන කාර්යාලය | Free |
| 17 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | පින්නවල සත්වෝද්‍යානය | 8000.00 |
| 18 | කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | පින්නවල සත්වෝද්‍යානය | 6000.00 |
| | | | 01 | ප්‍රධාන කාර්යාලය | |
| 19 | කාබනික පොහොර නිෂ්පාදනය හා කාබනික එළවළු වගාව | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 04 | ගෝනපොල ගොවිපොල | Free |
| 20 | Budget Progress Monitoring System ප්‍රායෝගික පුහුණුව | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 01 | ප්‍රධාන කාර්යාලය | Free |
| | | | 01 | දෙහිවල සත්වෝද්‍යානය | |

| අනු අංකය | පුහුණු පාඨමාලාව | පුහුණුව පවත්වන ලද ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | උප ආයතනය | වැය කළ මුදල (රු) |
|---|---|---|---|---|---|
| 21 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | නිපුණතා සංවර්ධන අරමුදල | 01 | පින්නවල සත්වෝද්‍යානය | 8500.00 |
| 22 | Strategies for Improving Workforce Productivity in the public Sector | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | 01 | ප්‍රධාන කාර්යාලය | Free |
| 23 | පිළිගැනීමේ නිලධාරීන්ගේ හා දුරකථන ක්‍රියාකරුවන්ගේ වෘත්තිය සංවර්ධනය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | පින්නවල සත්වෝද්‍යානය | 12000.00 |
| | | | 01 | ප්‍රධාන කාර්යාලය | |
| 24 | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | නිපුණතා සංවර්ධන අරමුදල | 01 | දෙහිවල සත්වෝද්‍යානය | 8500.00 |
| 25 | ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | පින්නවල අලි අනාථාගාරය | 3000.00 |
| 26 | රජයේ වාහන නඩත්තුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | පින්නවල අලි අනාථාගාරය | 3000.00 |
| 27 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | පින්නවල සත්වෝද්‍යානය | 16000.00 |
| | | | 01 | පින්නවල අලි අනාථාගාරය | |
| 28 | විනය කාර්ය පටිපාටිය | නිපුණතා සංවර්ධන අරමුදල | 01 | පින්නවල සත්වෝද්‍යානය | 8500.00 |
| 29 | Advanced Excel | නිපුණතා සංවර්ධන අරමුදල | 02 | පින්නවල සත්වෝද්‍යානය | 30000.00 |
| 30 | රියදුරන්ගේ රාජකාරි හා වගකීම් | නිපුණතා සංවර්ධන අරමුදල | 02 | ප්‍රධාන කාර්යාලය | 17000.00 |
| 31 | Advanced Excel | නිපුණතා සංවර්ධන අරමුදල | 01 | පින්නවල සත්වෝද්‍යානය | 15000.00 |
| 32 | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | නිපුණතා සංවර්ධන අරමුදල | 01 | පින්නවල සත්වෝද්‍යානය | 8500.00 |
| 33 | පරිපාලන නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | 03 | ප්‍රධාන කාර්යාලය | Free |
| | | | 03 | දෙහිවල සත්වෝද්‍යානය | |
| 34 | නායකත්ව කුසලතා හා පෞරුෂත්ව සංවර්ධනය | වෘත්තීය සංවර්ධන ආයතනය | 01 | දෙහිවල සත්වෝද්‍යානය | 20000.00 |
| 35 | නායකත්ව හා පෞරුෂත්ව සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | නිපුණතා සංවර්ධන අරමුදල | 02 | පින්නවල සත්වෝද්‍යානය | 17000.00 |
| 36 | කාර්යාභිවර්ධන පුහුණුව | නිපුණතා සංවර්ධන අරමුදල | 01 | පින්නවල අලි අනාථාගාරය | 8500.00 |
| 37 | Workshop on Innovative and Strategic Leadership for Enhancing Public Sector Productivity | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 01 | දෙහිවල සත්වෝද්‍යානය | Free |
| 38 | Workshop on ISO 14001:2015 Standard and Implementation of Environmental Mgt System | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 01 | දෙහිවල සත්වෝද්‍යානය | 56,326.54 |
| | | | 02 | පින්නවල සත්වෝද්‍යානය | |
| | | | 01 | ගෝනපොල ගොවිපොල | |
| | | | 01 | සෆාරි උද්‍යානය | |
